ඝාතන දිවි තොර කර ගැනීමක් හෝ ඝාතනයකට පසු දිවි තොර කරගැනීමට තැත් කිරීමක් යනු අතිශයින්ම සංකීර්ණ මනෝභාවයන් හා සාධක ගණනාවක් ඔස්සේ සිදුවන්නක් බැව් නොකිවමනායි. එහිදී දිවි ගලවා ගත් අයට, සිදුවීමට අදාළ අයගේ පවුල් වලට මෙන්ම, සමස්ත ප්‍රජාවන්ටද එවැනි සිදුවීමක් කම්පනයක් ගෙන දිය හැකියි. මෙවැනි සිදුවීමක් අවශ්‍ය සහකම්පනයෙන්, ප්‍රවේශමෙන් සහ ආචාර ධාර්මික ප්‍රවේශයෙන් වාර්තා කිරීම අත්‍යවශ්‍ය වන්නේද ඒ හෙයිනි.

ඝාතන දිවි තොර කරගැනීමක් වාර්තා කිරීමේදී, වෙනත් අයට එය කම්පනයක් හා දරුණු සිත් වේදනාවක් සිදුවීම හැකිතාක් අවම කිරීමටත්, අනුකාරක සිදුවීම් වලට මග පෑදීම අවම කිරීමටත් හැකිවන්නේ, එහිදී මාධ්‍ය මාර්ගෝපදේශයන් අනුගමනය කිරීම ඔස්සේ බව Ethics Eye අපි නැවත නැවතත් සිහිපත් කර ඇත්තෙමු.

වත්තල ප්‍රදේශයේදී කාන්තාවක් සිදුකළ ඝාතන දිවි තොර කරගැනීම් ප්‍රයත්නය සිළුමිණ පුවත්පතේ (ජූනි 19, 2022) වාර්තා වී තිබුණේ, "තම පුතු ගඟ පතුලට යැවූ අරුම පුදුම මවක්" යන සිරස්තලයද සමගිනි.

මෙහිදී මෙවැනි සංකීර්ණ සිදුවීමක් වාර්තා කිරීමේදී ඇවැසි සහකම්පනය මෙම ලිපිය තුළ නොමැත්තේ මන්ද, එසේම මෙය මානසික සෞඛ්‍ය ගැටළුවක්ය යන කෝණයෙන් වාර්තා වී නොමැත්තේ මන්ද යන කරුණු පාඨකයින් ලෙසින් අප විශේෂයෙන්ම ප්‍රශ්න කළ යුතු නොවේද?

එසේම, ඝාතන දිවි තොර කරගැනීම් ප්‍රයත්නය සිදුවූ ස්ථානයේ ඡායාරූප පළ කිරීම, දිවි තොර කරගැනීමට තැත් කළ අයට දෝෂාරෝපණය එල්ල කිරීම ඇතුළත්, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට එකඟ නොවන ආකාරයේ මාධ්‍යකරණයක් ඔස්සේ, අනුකාරක සිදුවීම් වලට ඉන්ධන සැපයෙනු නැතිද?

මෙවැනි පුවත් වාර්තාවක් හෝ ලිපියක් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීමෙන්, අනුකාරක සිදුවීම් අවම කරගැනීමටත්, තවත් එක් ජීවිතයක් හෝ බේරාගැනීමටත් ඉඩ ප්‍රස්තාව නොසැලසෙන්නේ ද?

විශේෂයෙන්ම සමස්ත රටක් ලෙසින් අප අර්බුදකාරී වාතාවරණයක සිටින මෙම කාලයේදී, මෙවැනි සිදුවීම් මහජන සෞඛ්‍ය පිළිබඳ ගැටළුවක් ලෙසින් සහකම්පනයෙන් යුතුව දැකීමත්, ඒ අයුරින්ම මෙවැනි සිදුවීම් වාර්තා කිරීමත් මාධ්‍ය අත ඇති සමාජ වගකීම නොවන්නේ ද?

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...